සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

**Royal College - Colombo 07** | කාලය පැය 02 යි.

**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

Grade 08- Second Term Test - July - 2019


**දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි - 8 ශ්‍රේණිය**

**චිත්‍ර කලාව I**

Name: .................................................. Class: ........................... Index No: ..............................

I වන කොටසෙහි ප්‍රශ්න සියල්ලට ම, ප්‍රශ්න පත්‍රයෙහි ම පිළිතුරු සපයන්න.

- **පහත දී ඇති රූපසටහන ඇසුරින් ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ඇති හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු සපයන්න.**



ඉහත රූප සටහනින් දක්නට ලැබෙන්නේ ලංකාවේ ඉදිකළ පළමු ස්තූපය ලෙස සැලකෙන 01. ........................................ දාගැබයි. 02. ....................................................................... යුගයට අයත් මෙම දාගැබ 03. ...................................................................... රජතුමා විසින් ඉදිකරවා ඇත. මෙම දාගැබේ තැන්පත් කොට ඇතැයි විශ්වාස කරන්නේ, බුදුන්වහන්සේගේ 04. ............................................ යි. පසු කාලීනව ලජ්ජිතිස්ස රජතුමා විසින් චෛත්‍ය වටකොට 05. ............................................................ ඉදිකරවා ඇති අතර අදට ද ශේෂ වූ තටඹුන් දක්නට ඇත.

- **නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

06. දම් වර්ණයෙන් රතු වර්ණය ඉවත්කළ විට ඉතිරිවන වර්ණය වනුයේ.,

    i. කහ ii. නිල් iii. කොළ iv. තැඹිලි

07. ද්විතියික වර්ණයක් නොවන්නේ.,

    i. නිල් ii. පච්ච iii. තැඹිලි iv. දම්

08. උල්වූ තුඩු සහිත ආරුක්කු, දළ බැවුම් සහිත වහලය ඇතිව නිර්මාණය කරනුලබන කිතුණු දේවස්ථාන ක්‍රමය හඳුනවනුයේ.,

    i. ගොතික් ක්‍රමය ii. පැරණි ක්‍රමය iii. යුරෝපානු ක්‍රමය iv. රෝමානු ක්‍රමය

සියලුමහිමිකම්ඇවිරිනි /All Rights Reserved

09. රුවන්වැලිසෑය කරවූ රජතුමා වනුයේ.,
   i. ලජ්ජිතිස්ස රජතුමා   ii. වලගම්බා රජතුමා
   iii. II විජයබාහු රජතුමා   iv. දුටුගැමුණු රජතුමා

10. උද්භිද ගණයට අයත් සැරසිල්ලක් නොවන්නේ.,
   i. පලාපෙති   ii. ලියවැල්   iii. කුන්දිරික්කන්   iv. සීන මල

11. අතීතයේ ජේතවනාරාම දාගැබේ ගර්භයේ හැඩය.,
   i. ඝටාකාර   ii. ඝණ්ඨාකාර   iii. බුබ්බුලාකාර   iv. ධාන්‍යාකාර

12. භූමි ස්පර්ශ මුද්‍රාව දක්වෙන බුදු පිළිම වලින් නිරූපණය වනුයේ.,
   i. බුදුන් සමාධි සුවයෙන් වැඩහිඳි අවස්ථාවයි.
   ii. බුදුරදුන් මහාකරුණා සමාපත්තියට සමවැදුන අවස්ථාවයි.
   iii. සිදුහත් බෝසතුන් බුද්ධත්වයට පැමිණි අවස්ථාවයි.
   iv. බුදුරදුන් පස්වග තවුසන්ට දම් දෙසන අවස්ථාවයි.

13. උඩරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ශාන්තිකර්මයක් වනුයේ.,
   i. පහන්මඩු ශාන්තිකර්මය   ii. දෙවොල්මඩු ශාන්තිකර්මය
   iii. කොහොඹාකංකාරි ශාන්තිකර්මය   iv. කුම්බාභිෂේකම් ශාන්තිකර්මය

14. ස්වාභාවික හා ස්වාභාවික නොවන අමුද්‍රව්‍ය භාවිතයට ගනිමින් ශාන්තිකර්ම සඳහා වන මඩුව සරසනු ලබන්නේ.,
   i. උඩරට නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්තිකර්ම සඳහායි.
   ii. හින්දුකෝවිල් ආශ්‍රිත ව පවත්වනු ලබන ශාන්තිකර්ම සඳහායි.
   iii. සබරගමු නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්තිකර්ම සඳහායි.
   iv. පහතරට නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්තිකර්ම සඳහායි.

15. මල්පෝච්චි, කැට, කුඩා පහන්, ගුරුලේත්තු සහ කුඩා ප්‍රමාණයේ විසිතුරු භාණ්ඩ නිර්මාණය සඳහා භාවිත කරණුයේ.,
   i. අත් සකපෝරුව   ii. මැටි වළලු හා මැටි පුවරු
   iii. පා සකපුවරුව   iv. ඇඹීම හා තෙළීම

**● අංක 21 සිට 25 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.**

16. පද්මනිධි : ..............................................................................................
..............................................................................................

17. කෝලම්රටා : ..............................................................................................
..............................................................................................

18. මිනාර් : ..............................................................................................
..............................................................................................

19. පද්මාසන : ..............................................................................................
..............................................................................................

20. අත් සකපෝරුව : ..............................................................................................
..............................................................................................

සියලුමහිමිකම්ඇවිරිනි /All Rights Reserved

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති ප්‍රකාශයන්හි හිස්තැනට ගැළපෙන පිළිතුර ලියා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

21. හිඳි බුද්ධ ප්‍රතිමාවක දෙපා පිහිටුවා ඇති ඉරියව්ව/ හිඳගෙන සිටින ආකාරය ......................... ක්‍රමය නමින් හැඳින්වේ.

22. ඉස්ලාමීය ආගමට අයත් දේවස්ථානවන පියස්සෙහි ගෝලාකාර සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක අංගය ................. ................................................ නමින් හඳුන්වයි.

23. පැදුරු කර්මාන්තයේ පන් හා තියද වර්ණ ගැන්වීමේ දී ............................................ වර්ණය සාදාගැනීම අරළු, බුළු කොටා තම්බාගැනීමෙන් සිදුකොට ඇත.

24. පොළොන්නරු ගල් විහාරයේ හිටි පිළිමය ............................................................ මුද්‍රාවෙන් යුතුව නෙලා ඇත.

25. හින්දු දේවාල වල පිවිසුමෙහි ඇති සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම ........................................ නමින් හඳුන්වයි.

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්න හරිනම් හරි ලකුණ ද, වැරදි නම් වැරදි ලකුණ ද ඉදිරියේ ඇති හිස්තැනෙහි යොදන්න.**

26. ලංකාවේ චෛත්‍ය නිර්මාණයේ දී දේවතා කොටුව වෙනුවට, ඉන්දියාවේ සාංචි ස්ථූපයේ හර්මිකාව නම් කොටස නිර්මාණය කර ඇත. (...........)

27. ක්‍රිස්තු දේවස්ථානයක බිම් සැලැස්ම සැම විටම සෘජුකෝණාශ්‍ර හැඩයක් ගනියි. (...........)

28. හින්දු භක්තිකයන් හිරු දෙවියන් මුල්කරගෙන ජනවාරි මාසයේ තෛපොංගල් උත්සවය පවත්වනු ලබයි. (...........)

29. රන්කොත් වෙහෙර නිශ්ශංකමල්ල රජතුමා විසින් ඉදිකරවන ලද චෛත්‍යයකි. (...........)

30. අභයගිරි දාගැබෙහි ගර්භය ධාන්‍යාකාර හැඩයක් ගනියි. (...........)

ලකුණු 30x1= 30

සියලුමහිමිකම්ඇවිරිනි /All Rights Reserved

Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

Grade 08- Second Term Test - July - 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි - 8 ශ්‍රේණිය

# චිත්‍ර කලාව II

Name: .................................................. Class: ............................ Index No: ..................................

එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන චිත්‍රයට නගන්න.

(සැලකිය යුතුයි: චිත්‍රය භාරදෙනවිට සම්පූර්ණ කර තිබිය යුතු ය. ඔබේ නම, පන්තිය, අංකය චිත්‍රය පිටුපස පැහැදිලිව සඳහන් කරන්න.)

## "අ" කොටස - ප්‍රකාශන චිත්‍ර

01. ගම්බද වෙළඳපොළක්.
02. ඇළක දොළක දියනාන ළමුන් පිරිසක්.
03. ඉරිදා ගමේ පොළ.
04. මාළු රැගත් ධීවර බෝට්ටු වෙරළට ඇවිල්ලා.

## "ආ" කොටස - මෝස්තර නිර්මාණය

05. ව්‍යුක්ත හැඩ යොදා දොර රෙද්දකට සුදුසු මෝස්තරයක්.
06. මල් සහ කොළ ඇසුරින් චිත්ත රෙද්දක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
07. චතුරස්‍රාකාර කුෂන් කවරයක් සඳහා සුදුසු මුළුතලමෝස්තරයක්.

## "ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

08. 'අපි වවමු. රට නගමු' යන තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරන්න.
09. ළමා කතන්දර පොතක් සඳහා සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. පාසලේ පැවැත්වෙන වාර්ෂික විවිධප්‍රසංගයට ආරාධිත අමුත්තන් සඳහා ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පතක් නිර්මාණය කරන්න.

(ලකුණු 70යි.)